# ඇල්ල ප්‍රාදේශීය සභාව
# බදුල්ල දිස්ත්‍රික්කය
---------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන
----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 09 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර,එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 24 වන දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ඇල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
---------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
----------------------

(අ) සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම රු.392,050 ක් අඩුවෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් එම වටිනාකමින් ආදායම් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම රු.242,802 ක් වැඩියෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් එම වටිනාකමින් ආදායම වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාළව දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු පොළී රු.762,891ක් ගිණුම්ගත කර නොතිබීමෙන් එම වටිනාකමින් වියදම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලිපිද්‍රව්‍ය තොගය රු.11,555 ක් අඩුවෙන් ගිණුම්ගත කිරීමෙන් එම වටිනාකමින් ජංගම වත්කම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජලනළ තොගය රු.29,900 ක් වැඩියෙන් ගිණුම්ගත කිරීමෙන් එම වටිනාකමින් ජංගම වත්කම් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයට අදාල කර්මාන්ත ණයහිමියෝ රු.21,773,660 ක් ගිණුම්ගත කර නොතිබීමෙන් එම වටිනාකමින් වියදම් හා ජංගම බැරකම් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක මුදල් රු.16,402 ක් ගිණුම්ගත නොකිරීමෙන් ජංගම වගකීම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) රු.18,202 ක් වූ සේවක ඇප තැන්පත් ගිණුම්ගත නොකිරීමෙන් එම වටිනාකමින් ජංගම වගකීම් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) වටිනාකම රු.121,526 ක් වූ සේවක ඇප තැන්පත් වත්කම් ලෙස හඳුනා නොගැනීමෙන් එම වටිනාකමින් වත්කම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ පොළී ආදායම් රු.15,120 ක් ගිණුම්ගත නොකිරීමෙන් එම වටිනාකමින් ආදායම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ අයෝජන රු.189,435 ක් වැඩියෙන් ගිණුම්ගත කිරීමෙන් එම වටිනාකමින් වත්කම් වැඩියෙන් දක්වා තිබුණි.

(ඕ) පුස්තකාල පොත් සඳහා ගෙවූ රු.17,435 ක් ගිණුම්ගත නොකිරීමෙන් එම වටිනාකමින් පුස්තකාල පොත් ගිණුම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

(අ) **ලැබිය යුතු ගිණුම්**

සමාලෝචිත වර්ෂය අවසන් දිනට රු.12,023,831 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂය තුළ වරිපනම් රු.6,311,200 ක්, වෙනත් ආදායම් රු.2,965,749 ක්, ජල ගාස්තු රු.1,893,264 ක් හා කඩ කුලී රු.505,679 ක් ඇතුළත් විය.

(ආ) **ගෙවිය යුතු ගිණුම්**

සමාලෝචිත වර්ෂය අවසන් දිනට රු.4,124,897 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂය තුළ විවිධ ණය හිමියෝ රු.715,724 ක්, කර්මාන්ත ණයහිමි රු.3,336,194 ක් හා විගණන ගාස්තු රු.72,979 ක් ඇතුළත් විය.

1.3.3 **විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.57,644,105 ක් වූ ගිණුම් විෂයයන් 03ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.4 **අනුකූල නොවීම්**

1.3.4.1 **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | | නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|---|
| | | | රු. | |
| (අ) | | 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනත | | |
| | (i) | 49 හා 52 වගන්ති | - | 2017 වර්ෂයේ සභා බල ප්‍රදේශය තුළ අනවසර ඉදිකිරීම් 16 ක් හඳුනාගෙන ඇති නමුත් ඒවා පිළිබඳව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) | 158 හා 159 වගන්ති | 11,518,152 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් අය කරගෙන නොතිබුණි. |
| | (iii) | 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 8 ඒ(1) වගන්තිය | 1,426,920 | සභා බල ප්‍රදේශය තුළ සංචාරක හෝටලයක් ඉදිකිරීම සඳහා අනුමැතිය ලබාදීමට පෙර ඉදිකිරීම් සිදුකර තිබීම හේතුවෙන් දඩ හා ගාස්තු වශයෙන් ගණනය කර තිබුණු මුදල සභාවට අයකර ගෙන නොතිබුණි. |
| (ආ) | | 1988 ප්‍රාදේශීය සභා(මූල්‍ය හා පරිපාලන) රීති | | |
| | (i) | රීති 29 | | දෛනික ලැබීම් නියමිත දිනට බැංකුගත කර නොතිබුණි. |
| | (ii) | රීති 156 | | ගෙවීම් මුදල් පොත නිවැරදිව පිළියෙල කර නොතිබුණි. |
| | (iii) | රීති 202 | 48,977 | ජලනළ උපාංග මිළදී ගැනීම් හා නිකුත් කිරීම් තොග ලේඛණ වල සටහන් කර නොතිබුණි. |
| | (iv) | රීති 218 | | වර්ෂයකට වරක් ඉඩම් හා ගොඩනැඟිලි සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |
| (ඇ) | | 1988 අංක 56 හා 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත හා 2008 ජනවාරි 23 දිනැති අංක 1533/16 දරන අතිවිශේෂ ගැසට්පත්‍රය. | | සමාලෝචිත වර්ෂය සඳහා පාරිසරික බලපත්‍ර ලබාගත යුතු ආයතන හඳුනා ගැනීම සඳහා වාර්ෂික සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.25,662,283 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.6,929,767 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන්තු ගත ආදායම | 2017 බිල්කළ ආදායම | 2017 රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන් තුගත ආදායම | 2016 බිල්කළ ආදායම | 2016 රැස්කළ ආදායම | 2016 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 9,544,308 | 4,837,999 | 1,670,325 | 3,293,250 | 5,006,630 | 6,177,542 | 4,525,705 | 659,845 |
| (ii) | කුලී | 715,200 | 818,838 | 537,806 | 1,777,394 | 715,200 | 277,610 | 474,916 | 240,283 |
| (iii) | වෙනත් ආදායම් | 6,157,000 | 4,773,390 | 17,337,170 | 11,778,790 | 6,108,600 | 7,543,433 | 10,563,678 | 4,637,678 |
| | එකතුව | 10,416,508 | 10,430,227 | 19,545,301 | 16,849,434 | 11,830,430 | 13,998,585 | 15,564,299 | 5,537,806 |

### 2.2.2. ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

2017 දෙසැම්බර් 31 දිනට මුළු බිල්කල ආදායම රුපියල් මිලියන 10.4 ක් වූ අතර, වර්ෂය තුල රැස්කල ආදායම රුපියල් මිලියන 19.5 ක් විය. කෙසේ වුවත් වර්ෂය අවසන් වන විට රුපියල් මිලියන 16.8 ක ආදායමක් අයකර ගැනීමට තිබුණු අතර, පෙර වර්ෂය සමඟ සැසඳීමේදී හිඟ ආදායම් සියයට 204 කින් වැඩිවී තිබුණි.

### 2.2.3 වෙනත් ආදායම්

සතිපොළ ටෙන්ඩර් කිරීමෙන් සභාවට ලැබිය යුතු රු.136,180 ක් අය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.821,969 ක් සහ මුද්දර ගාස්තු රු.2,128,665 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය,පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **ක්‍රියාකාරී සැලැස්ම**

---------------------

2017 වර්ෂයට ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ආ) **අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

---------------------------------------------------

2014 වර්ෂයේදී ඇල්ල ප්‍රාදේශීය සභා කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.2,222,335 ක් වැය කර තිබුණද, මේ දක්වා අපේක්ෂිත නිමවුම් මට්ටමට ළඟා වී නොතිබුණි.

(ඇ) **අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනිම**

-----------------------------------------

ඇල්ල ආර්ථික මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් 2016 වර්ෂයේ රු.8,400,000 ක් වැය කර තිබුණද, අපේක්ෂිත ඉඩම මේ දක්වා අත්පත් කරගෙන නොතිබුණි.

(ඈ) **තිරසර සංවර්ධන අරමුණු**

---------------------------

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගු කාලීන සැලසුම් 2017 දෙසැම්බර් 31 දින තෙක් සකස් කර නොතිබුණි.

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

2016 දෙසැම්බර් 31 දිනට සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණ හා යෝජනා 09 කින් 06 ක්, 2017 දෙසැම්බර් 31 දිනය වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

3.3 **මානව සම්පත් කළමනාකරණය**

------------------------------------

2017 දෙසැම්බර් 31 දිනට සේවකයින් 30 දෙනෙකුගේ අතිරික්තයක් සහ සේවකයින් 07කගේ ඌනතාවයක් පැවතුණි.

3.4 **හඳුනාගත් පාඩු**

-----------------

(අ) සභාව සතු වාහන සඳහා 2016/2017 වර්ෂවල ආදායම් බලපත්‍ර ලබා ගැනීම නියමිත දිනට සිදු නොකිරීම හේතුවෙන් රු.4,052 ක් දඩ වශයෙන් ගෙවා තිබුණි.

(ආ) ටෙන්ඩර් ප්‍රසිද්ධ කිරීම සඳහා පුවත්පත් දැන්වීම් වෙනුවෙන් රු.50,715 ක් ගෙවා තිබුණද වාහනය මිළදී ගැනීමේ ටෙන්ඩර් කටයුතු අවලංගු කර තිබුණි.

(ඇ) 2014 වර්ෂයේ ඇල්ල ප්‍රාදේශීය සභා කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරිමේදී ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ උපදෙස් හා කොන්දේසි නොසලකා රු.2,222,335 ක් වැය කර ඉදිකරන ලද ගොඩනැගිල්ල නාය යෑම හේතුවෙන් විනාශ වී තිබුණි.

3.5 **ප්‍රසම්පාදනය**

--------------

3.5.1 **ප්‍රසම්පාදන සැලැස්ම**

----------------------

ප්‍රවර්තන වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

3.5.2 **කොන්ත්‍රාත් පරිපාලනය**

------------------------------

(අ) ඇල්ල ප්‍රාදේශිය සභා නව ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා පෞද්ගලික කොන්ත්‍රාකරුවෙකු සමඟ රු.50,124,060 ක වටිනාකමකට 2016 මැයි 15 දින ඇතිකරගත් ගිවිසුම මත අදාල ඉදි කිරීම් 2017 ජනවාරි 15 දින අවසන් කල යුතු වුවත්, 2017 ඔක්තෝබර් 31 දිනය වන විටත් අවසන් කර නොතිබුණු අතර ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද ගාස්තු රු.2,506,203 ක් අය කරගෙන නොතිබුණි.

(ආ) රු.3,870,190 ක වටිනාකමකින් යුත් ඇල්ල ශරීර සුවතා මධ්‍යස්ථානය ඉදි කිරීමේ ව්‍යාපෘතිය අවස්ථා දෙකකදී ප්‍රජා පාදක සංවිධාන දෙකක් මඟින් ඉටුකර තිබූ නමුත්, සමස්ථ ඉදි කිරීම සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර අනුමත කර ගෙන නොතිබුණි.

4. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

-----------------------------------------

4.1 **අයවැය පාලනය**

------------------

සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ආදායම් හා වියදම් සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

4.2 **අභ්‍යන්තර විගණනය**

------------------------

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

5. **පද්ධති හා පාලන**

-------------------

විගණනයේදී නිරීක්ෂණය වු අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | ගිණුම් ශේෂය හා උපලේඛණවල දැක්වෙන ශේෂයන් අතර වෙනස්කම් පැවතීම. |
| | | (ii) | ගෙවීම් නිවැරදිව වර්ගීකරණය කර ගිණුම්ගත කර නොතිබීම. |
| (ආ) | තොග පාලනය | | ක්ෂණිකව හරි වැරදි බැලිය හැකි ආකාරයකට භාණ්ඩ ගබඩා කර නොතිබීම. |
| (ඇ) | වාහන පාලනය | (i) | යන්ත්‍ර උපකරණවල දෛනික ධාවන විස්තර පවත්වා නොතිබීම. |
| | | (ii) | වාහන නඩත්තු කිරීම සම්බන්ධ කාර්මික නිලධාරීන්ගේ අධීක්ෂණය ලබාගෙන නොතිබීම. |
| (ඇ) | ඉදිකිරීම් පාලනය | | ඉදිකිරීම් කර්මාන්ත ප්‍රමාණවත් පරිදි අධීක්ෂණය හා පාලනය සම්බන්ධයෙන් වාර්තා පවත්වාගෙන ගොස් නොතිබීම. |